**බිබිල ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 05 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 22 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**මෙම** වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් ඉදිකරමින් පවතින වාණිජ ගොඩනැගිල්ල සඳහා රු. 6,200,000 ක මුදලක් දේශිය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබා ගැනීම අනුමත කර තිබූ අතර ඉන් රු. 5,549,570 ක් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාරයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සභාව සතු රු. 1,200,000 ක් වටිනා ගොඩනැගිලි 02 ක වටිනාකමද සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද රු. 2,430,801 ක් වටිනා සභා භූමියේ ඉදිකර ඇති වාහන නැවතුම්පල ගොඩනැගිල්ලේ වටිනාකම ද ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව විසින් ගෙවිය යුතු රු. 1,153,779 ක වියදම සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

ගිණුම් විෂයන් 22 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 161,761,592 ක් වූ අතර ගිණුම්කරණ සටහන් හා උපයෝගි ලේඛන අනුව ශේෂය රු. 187,188,696 ක් විය.

1.3.3 **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලේ ශේෂය රු. 1,144,694 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,645,992 ක වත්කම් විෂයන් 02 ක් හා රු. 58,837,660 ක වගකීම් විෂයයන් 03ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1)(i) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව ආදේශක සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා පුද්ගලයකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.130,080 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

03. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 43,192,288 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,959,401 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 49,151,689 ක් විය.

## 2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.49,151,689 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳව විග්‍රහයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | **2013** | **2014** | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් හා බදු | 5,268,501 | 10,271,950 | 5,003,449 | |
| කුලී ආදායම් | 5,928,581 | 291,051 | (5,637,530) | |
| බලපත්‍ර ගාස්තු | 618,605 | 167,762 | (450,843) | |
| සේවා සඳහා ගාස්තු | 439,561 | 912,305 | 472,744 | |
| දඩ හා වරෙන්තු ගාස්තු | 891,402 | 771,334 | (120,068) | |
| වෙනත් ආදායම් | 2,740,453 | 3,248,048 | 507,595 | |
| ආදායම් ආධාර | 17,350,964 | 20,063,826 | 2,712,862 | |
| | | | -------------- | 2,488,209 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| වැටුප් හා දීමනා | 19,381,052 | 13,205,291 | 6,175,761 | |
| ගමන් වියදම් | 675,302 | 1,232,699 | (557,397) | |
| සැපයුම් හා උපකරණ | 2,452,901 | 2,398,982 | 53,919 | |
| ප්‍රාග්ධන වත්කම් | 1,315,090 | 2,243,687 | (928,597) | |
| අලුත්වැඩියා හා නඩත්තුව ප්‍රාග්ධන සම්බන්ධතා, ආවශ්‍යතා හා සේවා | 1,914,597 | 1,651,035 | 263,562 | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 1,387,031 | 53,234,463 | (51,847,432) | |
| ආධාර මුදල් දායක මුදල් හා සහනාධාර | 51,482 | 4,327 | 47,155 | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 101,211 | 4,948,080 | (4,846,869) | |
| | | | --------------- | |
| | | | | (51,639,898) |
| | | | | -------------- |
| පුනරාවර්තන ආදායමේ අඩුවීම | | | | **(49,151,689)** |
| | | | | ========= |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.46,513,360 ක් වු හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 හා 159 වගන්තියේ විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

### 2.3.2 වරිපනම් බදු

(අ) 2010 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා හිඟ වරිපනම් බදු වශයෙන් අයවිය යුතු රු.12,709,961 ක් අයකර ගැනිමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට රජයේ ආයතන 06 කින් අයවිය යුතු රු. 209,382 ක් අයකර ගැනිමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

### 2.3.3 බදු කුලී

(අ) 2014 ජූලි 28 දිනැති අංක එම්ඕ/ආර්පි/363 දරණ තක්සේරු වාර්තාව ප්‍රකාරව බිබිල පොදු වෙළඳපොළ කඩ කාමර 67 ක් වසර 03 ක කාලයක් සඳහා බදු දෙන ලෙස කරන ලද දැන්විම ප්‍රකාරව බදු නොදීම නිසා ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.6,566,400 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර 23 ක කුලි තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පොදු වෙළඳපල ගවමස් කඩය රු. 1,521,075 ක මුදලකට බදු දීමට තීරණය කර අවස්ථා 03 කදී මිළ ගණන් කැඳවුවද කිසිදු මිළ ගණනක් ඉදිරිපත් නොවු නමුත් 2014 පෙබරවාරි 10 දින එක් ඉල්ලුම්කරුවකු රු. 1,100,000 ට ගවමස් කඩය ලබාදෙන ලෙස ලිඛිතව ඉල්ලීම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ ජනවාරි 17 දින සභාව විසින් මිළ ගණන් කැඳවීමකින් තොරව දේපල බදු නොදිය යුතු බවට ගත් තීරණය මත සමාලෝචිත වර්ෂය සඳහා රු. 1,100,000 ක ආදායමක් සභාවට අහිමි වී ගොස් තිබුණි.

2.3.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 5,644,374 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 3,792,912 |
| මුද්දර ගාස්තු | 1,851,462 |

03. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරිමට හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 301,270 ක් වියදම් දරා තිබූ අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය, සවි කළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව විස්තර වාර්තාගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දී සංවර්ධන වැඩ සටහන් 03 ක් යටතේ අනුමත කර තිබූ රු.12,950,000 ක කර්මාන්ත 13 ක් සඳහා වූ ව්‍යාපෘති විවිධ හේතු නිසා සභාව විසින් ආරම්භ කර නොතිබුණි.

(ඇ) ස්ථිර මාර්ග කම්කරුවන් දෙදෙනෙකු අදාල කාර්යය සඳහා යොදා නොගෙන කාර්යාලයේ අනුමත කාර්යය මණ්ඩලය අනුව කළමනාකරණ සහකාර සේවයේ දැනට පුරප්පාඩු නොතිබියදී විවිධ විෂයයන්ට අදාල කළමණාකාර සහකාර තනතුරුවල රාජකාරී පවරා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල සහකාර, සෞඛ්‍ය කම්කරු හා රියදුරු තනතුරු සඳහා අනියම් පදනම මත 2012 හා 2013 වර්ෂවලදී බඳවාගෙන සේවය කරන ලද සේවකයින් තිදෙනෙකු ස්ථිර සේවයට පත්කර තිබූ මුත් එම නිලධාරීන් සභාවේ අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත්ව නොතිබුණි.

3.2 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

2009 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමණාකරන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. 1,484,376 ක්ද, සභා අරමුදලින් රු. 94,915 ක වියදමක් දරා තිබුණි.

(අ) ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) රු. 1,579,291 ක වියදමක් දරා තිබුණද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. කසල බැහැර කිරීමේ කටයුතු පරිසරයට හිතකර ආකාරයට සිදු නොවන අතර, මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ තව දුරටත් මෙම ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා සකස් කර ඉදිරිපත් කර තිබුණද ඒවා කඩිනමින් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු. 189,460 ක අතිරේක වියදමක් දරා පුවක් පැළේ ස්ථානයේ කසල බැහැර කිරිම සඳහා වළවල් සකස් කර තිබුණි.

04. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය